**නියාගම ප්‍රාදේශීය සභාව**

**ගාල්ල දිස්ත්‍රික්කය**

---------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 සැප්තැම්බර් 29 දින සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට නියාගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ශුද්ධ වත්කම්වල අගය අඩුවීම

සමාලෝචිත වර්ෂය ආරම්භයේ පැවති රු.2,295,837 ක් වූ සමුච්චිත අරමුදල් ගිණුමේ හර ශේෂය වර්ෂය අවසාන වනවිට රු.10,485,708 ක් දක්වා වර්ධනය වී තිබුණි. පසුගිය වර්ෂයේ රු.2,272,955 ක් වූ කාරක ප්‍රාග්ධනය සමාලෝචිත වර්ෂයේ රු.6,543,434 ක සෘණ ශේෂයක් දක්වා රු.8,816,389 කින් පිරිහීම නිසා කාරක ප්‍රාග්ධන දුෂ්කරතා ඇතිවිය හැකි බව නිරීක්ෂණය විය.

#### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ දී මිලදී ගෙන තිබුණු රු.343,372 ක් වූ විදුලි භාණ්ඩ ගිණුම් ගතකර නොතිබුණි.

(ආ) රු.2,121,464 ක් වූ ලැබිය යුතු උසාවි දඩ ආරම්භක ශේෂය ගිණුම්වලින් මඟහැරී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන වැය ගිණුම්ගත කිරීමේ දී රු.2,870,734 ක් වැඩිපුර දක්වා තිබුණි.

**1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

**(අ) ලැබිය යුතු ගිණුම්**

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) සභා බලප්‍රදේශයේ සිදුකළ සංවර්ධන ව්‍යාපෘති සඳහා ලැබිය යුතු රු.9,830,779 ක් නිරවුල් කර ගැනීමට සමාලෝචිත වර්ෂයේදී ද කටයුතු කර නොතිබුණි.

(ii) සභාව සතු බැකෝලෝඩර් යන්ත්‍රය සහ ගල්රෝල කුලියට දීම වෙනුවෙන් වර්ෂ 02 කට වැඩි කාලයක සිට අයවිය යුතුව තිබුණු රු.42,780 ක් අයකර ගෙන නොතිබුණි.

**(ආ) ගෙවිය යුතු ගිණුම්**

වර්ෂ කිහිපයක සිට ඉදිරියට ගෙන එමින් පවතින රු.182,193 ක කර්මාන්ත ණයහිමි ශේෂයක් නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේ දීත් කටයුතු කර නොතිබුණි.

**1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

**විගණනයට තොරතුරු ඉදිරිපත් නොකිරීම**

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.47,221,724 ක් වූ ගිණුම් විෂයයන් 02 ක් විගණනයේ දී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

**1.3.5 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම් |
|---|---|---|
| | රු. | |
| **(අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති** | | |
| (i) රීති 33 | - | වරිපනම් බදු ගෙවීම් පැහැර හැර ඇති පුද්ගලයින් පිළිබඳ ලැයිස්තු සහ දේපල තහනම් කිරීමේ වරෙන්තු ලැයිස්තු පිළියෙල කර නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ii) | රීති 180 සිට 184 දක්වා | - | ඇප ලබා ගතයුතු නිලධාරීන් 18 දෙනෙකුගෙන් ඇප මුදල් ලබාගෙන නොතිබුණි. |
| (iii) | රීති 193 | - | අයවැය සමඟ අය හා වැය විෂයයන් සසඳා අතිරික්තතා හා ඌණතාවලට හේතු දැක්වෙන ප්‍රකාශනයන් දෙසැම්බර් 31 දිනට පිළියෙල කර, විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |

**(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය**

| | | |
|---|---|---|
| මුදල් රෙගුලාසි 571 | 93,000 | වර්ෂ 05 කට අධික කාලයක සිට ඉදිරියට ගෙන එමින් පවතින තැන්පතු 27 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.2,366,313 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.2,861,355 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 740,304 | 729,440 | 624,161 | 616,980 | 497,749 | 505,702 | 494,947 | 532,025 |
| (ii) | කුලී | 5,844,840 | 4,606,152 | 4,312,721 | 796,308 | 4,051,040 | 3,718,428 | 2,475,940 | 542,387 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 611,000 | 731,597 | 715,197 | 60,217 | 511,000 | 655,485 | 659,710 | 42,037 |
| | | 7,196,144 | 6,067,189 | 5,652,079 | 1,473,505 | 5,059,789 | 4,879,615 | 3,630,597 | 1,116,449 |

### 2.2.2 වරිපනම් හා බදු

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ වෙනුවෙන් අයකර ගත යුතුව තිබුණු රු.1,261,465 ක් වූ වරිපනම් හා බදු වලින් සමාලෝචිත වර්ෂය තුළ රු.624,161 කට සමානව සියයට 49 ක් අයකර ගෙන තිබුණි. හිඟ මුදල් අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158(1)(අ) වගන්තිය ප්‍රකාර කටයුතු කර නොතිබුණි.

### 2.2.3 බදු කුලී

සමාලෝචිත වර්ෂයට අදාළව අයකර ගතයුතු වූ රු.5,148,539 ක හිඟ බදුකුලී ශේෂයෙන් වර්ෂය තුළ රු.4,312,721 ක් හෙවත් සියයට 84 ක් අය කරගෙන තිබුණි.

### 2.2.4 බලපත්‍ර ගාස්තු

සමාලෝචිත වර්ෂයට අයකර ගතයුතු වූ රු.773,634 ක් වූ බලපත්‍ර ගාස්තුවලින් අයකිරීම් සියයට 92 ක් වී තිබුණි.

### 2.2.5 මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2017 දෙසැම්බර් 31 දිනට මුද්දර ගාස්තු වෙනුවෙන් රු.5,583,229 ක් ලැබිය යුතුව තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

#### (අ) ක්‍රියාකාරී සැලැස්ම

පනවා තිබූ අතුරු ව්‍යවස්ථා අනුව සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

#### (ආ) කර්තව්‍යයන් ඉටු කිරීමේ ප්‍රමාදයන්

ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ ජාතික වැඩසටහන යටතේ නියාගම ප්‍රාදේශීය සභා ක්‍රීඩාපිටිය නවීකරණය කිරීම සඳහා රු.4,470,731 ක් හා පළාත් සභා මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ ව්‍යාපෘති 04 ක් සඳහා එකතුව රු.450,000 ක් සමාලෝචිත වර්ෂය සඳහා අනුමත කර තිබූ නමුත්, 2017 දෙසැම්බර් 31 දින වනවිට අදාළ ව්‍යාපෘති ආරම්භ කර නොතිබුණි.

**(ඇ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය**

**--------------------------------**

සභාව විසින් ක්‍රියාත්මක කරන ලද කොම්පෝස්ට් ව්‍යාපෘතිය 2015 වර්ෂයේ සිට නවතා දමා තිබූ අතර, 2016 වර්ෂයේ දී අකුණු සැර වැදීම හේතුවෙන් අදාළ යන්ත්‍රසූත්‍ර වලට හානි සිදු වී තිබුණි. ප්‍රදේශයේ ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා දීර්ඝකාලීන විසඳුම් සභාව සතු නොවූ අතර, මසකට රු.5,000 ක වියදමක් දරා පෞද්ගලික සමාගමකට අයත් ඉඩමකට කසළ බැහැර කිරීම සිදුකර තිබුණ ද, මේ සඳහා පරිසර බලපත්‍රයක් ලබාගෙන නොතිබුණි.

(ඈ) **තිරසර සංවර්ධන ඉලක්ක**

**--------------------------**

තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයේ, තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක සඳහා වන ගෝලීය දර්ශක තුලින් සභා බලප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නැංවීම සඳහා වන යම් දිගුකාලීන සැලසුම් සභාව විසින් සකස් කර ක්‍රියාත්මක කර තිබුණ ද, එය ප්‍රමාණවත්ව විෂය ක්ෂේත්‍රය ආවරණය කර නොතිබුණි.

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

-----------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) වගන්තිය ප්‍රකාරව සහකාර පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය ඇතිව දියුණු කළ ප්‍රදේශ වශයෙන් ප්‍රාදේශීය සභාව විසින් ප්‍රකාශයට පත් කරන ලද ප්‍රදේශ ඇතුළත පිහිටි යම් නිශ්චල දේපළක හෝ නිශ්චල හෝ නිශ්චල දේපළ වර්ගයක වාර්ෂික වටිනාකම මත වරිපනම් බද්දක් අය කළහැකි වුවත්, සභා බලප්‍රදේශයේ එවැනි ප්‍රදේශ හඳුනාගෙන වරිපනම් බදු අයකිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සභාවට අයත් වෙළඳ සංකීර්ණ බදුදීම වෙනුවෙන් 2017 දෙසැම්බර් 31 දිනට රු.178,100 ක් අයවිය යුතුව තිබූ අතර, ප්‍රාදේශීය සභා පනතේ 159(1) වගන්තිය ප්‍රකාරව එම මුදල අයකර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි.

(ඇ) සභාවේ සේවකයන් වෙනුවෙන් සේවක අර්ථසාධක අරමුදලේ ආයතනික දායකත්වය වූ රු.803,294 ක් හා 1991 වර්ෂයේ සිට පැවත එන රු.34,159 ක් වූ ගෙවිය යුතු පිරිවැටුම් බදු ශේෂයක්, අදාළ ආයතන වෙත ගෙවීම් කර, නිරවුල් කිරීමට කටයුතු නොකර, සභා ලේකම්වරියගේ අනුමැතිය මත සමාලෝචිත වර්ෂයේ සභාවේ ආදායමට ගෙන තිබුණි.

**3.3 මානව සම්පත් කළමනාකරණය**

-----------------------------------

**(අ) සේවක පුරප්පාඩු හා අතිරික්ත**

---------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) සේවක සංඛ්‍යා සැලැස්මේ අනුමත තනතුරු 06 ක පුරප්පාඩු පැවැති අතර, ඒවා සම්පූර්ණ කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ii) සභාවේ සේවකයින් 05 දෙනෙකු වෙනුවෙන් වැඩිපුර ගෙවූ වැටුප් රු.108,500 ක් සමාලෝචිත වර්ෂය අවසානය වනවිටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**(ආ) සේවක ණය**

-------------

සභාවේ සේවය කළ සේවකයන් 08 දෙනෙකුට අදාළව රු.129,700 ක අය නොවන ණය ශේෂයක් පැවති අතර, අයකර ගැනීමට විධිමත් පියවර ගෙන නොතිබුණි.

**3.4 ආර්ථික නොවූ ගනුදෙනු**

-------------------------

සමාලෝචිත වර්ෂයේ සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම සඳහා පුවත්පත් දැන්වීම් පල කිරීමට රු.141,200 ක් වැයකර තිබූ නමුත්, සමාලෝචිත වර්ෂය තුළ රු.2,780,602 ක් වූ විවිධ මිලදී ගැනීම්, වෙනත් සැපයුම්කරුවන්ගෙන් මිලදී ගෙන තිබීම හේතුවෙන් සැපයුම්කරුවන් ලියාපදිංචිය සඳහා දැරූ මුදල ආර්ථික නොවූ වියදමක් වී තිබුණි.

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

--------------------------------------

**4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

------------------------------

සමාලෝචිත වර්ෂයට අදාළ සංශෝධිත මූල්‍ය ප්‍රකාශන 2018 ජූලි 19 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

**4.2 අයවැය පාලනය**

-------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැයගත හා තථ්‍ය ආදායම් හා වියදම් අතර පහත විස්තර දැක්වෙන පරිදි සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන්, අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

(අ) වියදම් විෂයයන් 07 ක එකතුව රු.11,966,961 ක් වූ ඉතිරි වීම් දක්නට ලැබුණු අතර, එම වටිනාකම සියයට 19 සිට සියයට 66 අතර පරාසයක පැවැතුණි.

(ආ) වියදම් විෂයයන් 03 ක අනුමත සීමාවන් ඉක්මවා රු.13,906,524 ක වියදම් දරා තිබුණු අතර, එම වටිනාකම සියයට 07 සිට සියයට 84 දක්වා පරාසයක පැවැතුණි.

(ඇ) ආදායම් විෂයයන් 05 ක ළඟාකර නොගත් ඉලක්කයන්ගේ එකතුව රු.11,085,663 ක් වූ අතර, එම වටිනාකම සියයට 08 සිට සියයට 44 අතර පරාසයක පැවැතුණි.

**4.3 අභ්‍යන්තර විගණනය**

----------------------

සභාව සඳහා අභ්‍යන්තර විගණන නිලධාරියෙක් පත්කර තිබුණ ද, අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

**4.4 විගණන හා කළමනාකරණ කමිටු**

--------------------------------------

2009 ජුනි 09 දිනැති අංක DMA/2009(i) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

**5. පද්ධති හා පාලන**

--------------------

විගණනයේ දී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින් වර සභාවේ අවධානයට යොමු කර ඇති අතර, පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.

| | **පද්ධතිය** | | **අඩුපාඩුව** |
|---|---|---|---|
| (අ) | ගිණුම්කරණය | (i) | ආදායම් නිවැරදිව ගිණුම් ගතකර නොතිබීම. |
| | | (ii) | ජර්නල් සටහන් සඳහා අනුමැතිය නොමැතිවීම. |
| (ආ) | ආදායම් රැස්කිරීම | (i) | හිඟ ආදායම් අයකර ගැනීමට විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබීම. |
| | | (ii) | දියුණු ප්‍රදේශ හඳුනාගෙන වරිපනම් ආදායම් වැඩි කරගෙන නොතිබීම. |
| (ඇ) | සේවක මණ්ඩල කළමනාකරණය | (i) | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කර නොතිබීම. |
| | | (ii) | හිඟ සේවක ණය අයකර නොගැනීම. |
| (ඈ) | අයවැය පාලනය | | ප්‍රායෝගික තත්ත්වයන්ට ගැලපෙන පරිදි අයවැය ලේඛනය සංශෝධනය කර නොතිබීම. |